# හෘද රෝග නිර්ණය කිරීමෙහිලා ජ්‍යොතිෂ ශාස්ත්‍රයෙහි උපයෝගීතාවය පිළිබඳ අධ්‍යයනයක්

ඒ. ඒ. ජයන්ත ජයසිරි, ඩබ්. එම්. චරිත් ලක්ෂාන් මධුශංඛ
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය,
mcharith121@gmail.com

ජ්‍යොතිෂ ශාස්ත්‍රය පුරාතනයේ පටන් ශ්‍රී ලාංකික සමාජය සමඟ තදානුබද්ධ ලෙස පැවතුණු මානව ශාස්ත්‍රයකි. මිනිස් ජීවිතය නම් තීර්ථ යාත්‍රාවට නොයෙකුත් විවිධ කම්කටොළු, දුෂ්කරතා, බාධක හා ලෙඩ රෝග පැමිණෙන විට ඒවායින් මිදීමට අවශ්‍ය මාර්ග දර්ශනය ජ්‍යොතිර් විද්‍යාව හරහා මනාව සපයනු ලබයි. අධ්‍යතන ශ්‍රී ලංකාවේ උග්‍ර සමාජ ප්‍රශ්නයක් වී පවතින බෝ නොවන රෝගී තත්ත්වයක් වන හෘද රෝග මෙම ජ්‍යොතිර් ශාස්ත්‍රය හරහා කල් තියා පුරෝකථනය කිරීමට හැකි ද යන්න මැන බැලීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය පරමාර්ථය විය. වයස අවුරුදු 40 ත් 70 ත් අතර වයස් සීමාවේ පසුවන හෘද රෝගී නොවන පුද්ගලයන් 20 දෙනෙකුගේ ජන්ම පත්‍ර මෙන්ම හෘද රෝගී පුද්ගලයන් 20 දෙනෙකුගේ ජන්ම පත්‍ර මෙම පර්යේෂණයේදී නියැදිය ලෙස උපයෝගී කොට ගන්නා ලදී. සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය යොදා ගනිමින් පිළියන්දල හා බණ්ඩාරගම ප්‍රදේශ ඇසුරෙන් අහඹු නියැදිය ඔස්සේ හෘද රෝගීන් නොවන පුද්ගලයන් තෝරා ගත් අතර දකුණු කොළඹ ශික්ෂණ මහා රෝහලේ හෘද රෝග ඒකකය ඇසුරෙන් හෘද රෝගී පුද්ගලයන් තෝරා ගන්නා ලදී. එසේම මෙම පර්යේෂණයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක ස්වභාවය පෝෂණය කරමින් ලිඛිත මූලාශ්‍ර මෙන්ම අලිඛිත මූලාශ්‍ර ද උපයෝගී කොට ගන්නා ලදී. පර්යේෂණයේ දී හඳුනාගත් හෘද රෝග වැළඳීමට තුඩුදෙන ප්‍රධාන ජ්‍යොතිෂමය න්‍යායන් හා සිද්ධාන්තයන් ලෙස රවි, සඳු, කුජ, ශනි, ගුරු හා රාහු යන ග්‍රහයන් දුර්වලව, පාප පීඩිතව, පාප ග්‍රහයන්ගේ නැකත්වල සිටිමින් දුෂ්ඨස්ථාන ගත වීම. කේන්ද්‍රයේ 4 වැන්න හා 5 වැන්න අධිපතියන් මෙන්ම භාවාධිපතියන් ද දුර්වලව පාප ග්‍රහයන් හා සංයෝගව සිටීම. එමෙන්ම පාප ග්‍රහයන්ගේ අසුබ ග්‍රහ දෘෂ්ටි ලැබීම. 22 දෙර්කාණාධිපතියා මෙන්ම 64 නවාංශකාධිපතියා ද හෘදය නියෝජනය කරන ග්‍රහයන් සමඟ මෙන්ම භාව ගත වීම. මෙම අසුබ ඵල නියෝජනය කරන ග්‍රහයකුගේ මහා දශා, අතුරු දශා හා විදසා ගමන් කරන කාල පරිච්ඡේදය තුළදී මෙම හෘදයාබාධයන් තත්ත්වයන් පැන නැගෙනු ලබයි. මෙම කරුණු බලවත්ව, ශක්තිමත්ව හා සුබව පිහිටා ඇති විට එය හෘදයට ආශිර්වාදයක් වේ. හෘදය ආරක්ෂා කරනු ලබයි. මෙම පර්යේෂණය හරහා වෛද්‍ය මානව විද්‍යාව ද පෝෂණය වන අතර වෛද්‍ය මානව විද්‍යාවට නව මානයක් ලබා දෙනු ලබයි.

**ප්‍රමුඛ පද** ජ්‍යොතිෂය; හෘදයාබාධ; වෛද්‍ය මානව විද්‍යාව; ග්‍රහයින්; දශාව